


ලංකා පොස්පේට් සමාගමේ දෛනික නිෂ්පාදනය ඉදිරියේදී මෙ.ටො. 450 දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව ලංකා පොස්පේට් සමාගමේ සභාපති දයා සඳගිරි මහතා රජයේ නිල පුවත් වෙබ් අඩවියට පැවසීය.

දැනට මෙම ආයතනයේ දෛනික නිෂ්පාදනය මෙ.ටො. 220ක් පමණ වන බව පෙන්වා දුන් සභාපතිවරයා, මෙම තත්ත්වය දැනට දිවයිනේ පවත්නා ඉල්ලුම සපුරාලීමට කිසිසේත් ම ප්‍රමාණවත් නොවන බව පැවසීය.

ඒ අනුව ලංකා පොස්පේට් සමාගම සිය දෛනික නිෂ්පාදනය වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් නව පොස්පේට් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට දැනටමත් කටයුතු යොදා ඇති අතර, එම කර්මාන්ත ශාලාව ලබන වසරේදී පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමී ව විවෘත කිරීමට අපේක්ෂා කරන බව සභාපතිවරයා වැඩිදුරටත් පවසයි.

ECB